ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## **<u>පුවත්පත් නිවේදනය</u>**

## **<u>ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට ධාරිතා ගොඩනැගීමේ පුහුණුවීම් මාලාවක්...</u>**

ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉල්ලීම අනුව ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය අධ්‍යාපන පරිපාලකයන්, නිලධාරීන්, විෂයමාලා සංවර්ධනය කරන්නන් සහ පාසල් ප්‍රධානීන් සඳහා විශේෂයෙන්ම සැකසූ ධාරිතා ගොඩනැගීමේ පුහුණු පාඨමාලා 5ක් සංවිධානය කර තිබේ. මෙම පාඨමාලා චෙන්නායි හි තාක්ෂණික ගුරු පුහුණු සහ පර්යේෂණ ජාතික ආයතනය(NITTTR) විසින් සිදු කිරීමට නියමිතය. ශ්‍රී ලංකා අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන් 200 දෙනෙකු පමණ මෙම පාඨමාලාවන්ගෙන් ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2. චෙන්නායි හි NITTTR අයතනය විසින්(i)පරිපාලකයන් සහ විෂයමාලා සංවර්ධනය කරන්නන් සඳහා විෂයමාලා නිර්මාණය සහ ඇගයීම සහ පුහුණු ද්‍රව්‍ය සංවර්ධනය (ii) පාසල් ප්‍රධානීන්ගේ නායකත්ව සහ කළමනාකරණ කුසලතා ඉහළ නැංවීම (iii) වෙබ් තාක්ෂණය භාවිතයෙන් අධ්‍යාපන යෙදවුම් නිර්මාණය (iv) ඵලදායි පරිපාලනය සඳහා තොරතුරු තාක්ෂණ මෙවලම් සහ (v) පරිපාලකයන් සඳහා තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව යන පුහුණු පාඨමාලා සංවිධානය කරනු ලැබේ.

3. 2022 මාර්තු 14 වන දින පැවති සමාරම්භක උත්සවය අමතමින් නියෝජ්‍ය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතා ධාරිතා ගොඩනැගීමේ පුහුණුවීම් සඳහා ඉන්දියාවේ සහයෝගය සහ ප්‍රවීණත්වය බෙදා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ මිතුරන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඉන්දියාව දක්වන කැපවීම අවධාරණය කළේය. කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලාංකික නිලධාරීන්ට ඉන්දියාවේ සංචාරය කළ නොහැකි බැවින් ඉන්දියාව e-ITEC වැඩසටහන යටතේ 2020 අප්‍රේල් මුල සිට මාර්ගගත පාඨමාලා ආරම්භ කළ බව ද මේ වන විට ශ්‍රී ලාංකිකයන් 600 දෙනෙකුට වැඩි පිරිසක් සෞඛ්‍ය, ආයුර්වේදය, පාලනය, ඛනිජ තෙල් සහ හයිඩ්‍රොකාබන්, පුනර්ජනනීය සහ විකල්ප බලශක්තිය, නගර සංවර්ධනය, කාන්තා

සවිබලගැන්වීම, තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂාව, පොලිස් කටයුතු, බැංකුකරණය සහ කළමනාකරණය, අධ්‍යාපනය, ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණය, කළමනාකාරණය මහ නායකත්වය යනාදී ක්ෂේත්‍රයන්හි මාර්ගගත පාඨමාලාවන්ගෙන් ප්‍රතිලාභ ලබා ඇති බව ද එතුමා සඳහන් කළේය.

4. විශේෂ දේශනයක් සිදු කළ ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජෙනරාල් ආචාර්ය සුනිල් ජයන්ත මහතා 21 වන සියවසේ අධ්‍යාපන අවශ්‍යතාවයන්හි වැදගත්කම අවධාරණය කරමින් ශ්‍රී ලංකාව සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමේ වැදගත්කම පෙන්වා දුන්නේය.

5. NITTTRහි අධ්‍යක්ෂිකා මහාචාර්ය උෂා නඩේෂන් මහත්මිය ගුරු පුහුණුව සහ ශ්‍රී ලංකාව ඇතුළු මිත්‍ර රටවල් සමඟ සහයෝගීතාවයන් ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිය ආයතනයේ පුරෝගාමී කාර්යභාරය පිළිබඳව අදහස් දැක්වීය. ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශයේ මානව සම්පත් අධ්‍යක්ෂිකා ජයනි තිලකරත්න, මෙම වැඩසටහනෙහි සම්බන්ධීකාරක ආචාර්ය පී. ඒ. රති, NITTTR හි ITEC සම්බන්ධීකාරක මහාචාර්ය පී. කුලන්තයිවලේ සහ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ තාක්ෂණික සහයෝගීතාවය පිළිබඳ උපදේශක සහ කාර්යාල ප්‍රධානී ආචාර්ය සුෂිල් කුමාර් යන මහත්ම මහත්මීහු ද මෙම සමාරම්භක උත්සවයට සහභාගී වූහ.

6. ඉන්දියාව සෑම වසරකම ශ්‍රී ලාංකික නිලධාරීන්ගේ කුසලතාවයන් ඉහළ නැංවීම සඳහා
පූර්ණ අනුග්‍රහය සහිත කෙටිකාලීන ITEC පුහුණු අවස්ථා 402ක් පිරිනමයි. එසේම ඉන්දියාව ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විවිධ විෂයන් හි ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රපති උපාධි සහ පර්යේෂණ කටයුතු ඉන්දියාවේ දී හැදෑරීම සඳහා සෑම වසරකම ශිෂ්‍යත්ව 710ක් පමණ ලබා දෙයි.

***

කොළඹ
2022 මාර්තු 17